S u d u K a l u S a h a A l i

# සුදු කළු සහ අළු සිනමාවේ

SHADES OF ASH

# සෙබළා හා සෙබළ බිරිඳ පලු!

**රියර් අද්මිරාල් සරත් වීරසේකර**

යුද්ධය බිහිසුනුය. ඉන් මිනිසුන් මැරෙති. දේපල විනාශ වෙති. රට අගාධයට වැටෙති. මේ බැව් නොදන්නේ කවුරුන්ද? සාමාන්‍ය දැනුමක් ඇති ශිෂ්ට සම්පන්න ඕනෑම මිනිසෙකුට යුද්ධයේ ඇති එම කුරිරු බව වටහා ගැනීමට තවත් අටුවා ටීකා අවශ්‍ය වන්නේ නැත.

අද අප මව් බිම මුහුණ පා ඇති ප්‍රධානතම 'ජාතික ප්‍රශ්නය' වනුයේ වර්තමාන ත්‍රස්තවාදී ප්‍රශ්නයයි. සටන් විරාමය මගින් මෙතෙක් කරන ලද මහා පරිමාණයේ යුද්ධය දැනට තාවකාලිකව නවතා දමා ඇති වුවද මෙම සටන් විරාමය කෙදිනක හෝ අවසන් වන්නේ එක්කෝ ස්ථිර සාමයෙන් නැත්නම් නැවතත් යුද්ධයෙන් බැව් අප කවුරුත් දැන සිටිය යුතු කරුණකි. ත්‍රස්තවාදියා කිසිසේත්ම නම්‍යශීලී නොවී වෙනම රාජ්‍යයක් සඳහාම පිට පොට ගසන්නම්, රටේ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීමට බැඳී සිටින ඕනෑම රජයක් නැවතත් යුද්ධයට අවතීර්ණ විය යුතුමය. මන්ද, එසේ නැතහොත් ත්‍රස්තවාදීන් තම අරමුණ ඉටු කර ගන්නා හෙයිනි. එම තීන්දුව ගන්නේ සෙබලා නොව දේශපාලනඥයන්ය. එසේ නැවතත් යුද්ධයක් ආරම්භ වුවහොත් ජීවිත පුද රටේ ආරක්ෂාව තහවුරු කරන්නේ යුධ සෙබලාය. සුදත් මහදිවුල්වැව, අශෝක හඳගමද ඇතුළුව සියලුම ජන කොටස්හි ආරක්ෂාව තහවුරු කරන්නේද සෙබලාය. සෙබලා භෞතික - මානසික වශයෙන් ශක්තිමත් නම් ත්‍රස්තවාදියා යුද්ධයට අවතීර්ණ වීමට පෙර දෙවරක් සිතයි. යුද වැද හෝ යුද නොකොට හෝ රටේත්, පුරවැසියන්ගේත් ආරක්ෂාව ස්ථාපිත කොට අප කාටත් අවශ්‍ය, සාමය, උදා කරලීමට සෙබලා සෘජුවම දායක වන්නේ ඒ ලෙසිනි.

එසේ නම් එවන් වූ සෙබලා දෙස සාමයට කැමති, ත්‍රස්තවාදීන්ට ගැති නොවන සියල්ලන්ම (කලාකරුවන්ද ඇතුළුව) කිසියම් හෝ ගෞරවයකින් යුතුව බැලිය යුතුය යැයි කීවොත් එය වැරදි නොවනු ඇත. මන්ද සෙබලා තම අඹු දරුවන් තනි කරමින්, උන් හදගිනි අවුළුවමින්, ශරීරාංග බිලිදෙමින්, ජීවිතය පරදුවට තබමින්, සටන් වදින්නේ මව් බිමේත් එහි පුරවැසියන්ගේත් ආරක්ෂාව සඳහා වීම නිසාය. එවන් වූ සෙබලාට යමෙක් ගරු නොකරයි නම් ඔහු එක්කෝ මව් බිමේ මෙම දැවෙන ප්‍රශ්නය ගැන කිසිම හැඟීමක් තැකීමක් හෝ වැටහීමක් නැති කෙනෙක් විය යුතුය. එසේත් නැතිනම් සෙබලා යනු ත්‍රස්තයනට වෙනම රටක් ලබා ගැන්මට ඉඩ නොදී යුද වදින තරුණයකු යන ආකල්පය දරන ත්‍රස්ත ගැතියෙක්ම විය යුතුය.

සෙබලාට සෙසු පුරවැසියන් ගරු කළ යුතුය යන්නෙන් අදහස් කෙරෙනුයේ ඔවුන් දුටු තැන වැඳ ආචාර කිරීම නොව ඔවුන් රටේ ස්වෛරීත්වය සඳහා දිවි හිමියෙන් කැපවන, පුරවැසි තමන්ගේ ආරක්ෂාව නිති සපයන, තම මව්බිමේ තමන්ගේම සොයුරන්ය යන ගෞරවය මුසු හැඟීමක් තම හද තුළ ජනිත කරවීමයි. එවන් වූ හැඟීමක් ජනිත කළ හැකි වන්නේ දේශයට ගරු කරන සුජාත, දේශාභිමානී හදවත් ඇති පමණි. එවන් වූ පුරවැසියෙක් කිසිම හේතුවක් නිසා හෝ සමස්තයක් වශයෙන්, කිසිසේත්ම සෙබලාට ගරහන්නේ නැත. ඔවුන්ගේ චිත්ත ධෛර්යය වැඩිවනු පිණිස මිස අඹමල් රේණුවකින් හෝ අඩුවන ලෙස කිසිත් කරන්නේ නැත. රටේ ඒකීයභාවය මුහුණ පා ඇති [illegible] තර්ජනය පිළිබඳ යථාර්ථය හරිහැටි අවබෝධ කරගත් සැම පුරවැසියෙකුම හැසිරෙන්නේ ඒ අයුරිනි.

තම මව් බිම, තම දේශය මුහුණපාන බැරෑරුම් අවස්ථාවලදී හෝ ඊට අදාළ ජාතික ප්‍රශ්නයකදී 'කලාකරුවාද' 'දේශප්‍රේමී' විය යුතුය යැයි මහා ගත්කරු රවින්ද්‍රනාත් තාගෝර් වරෙක පැවසූ බැව් මා අසා ඇත්තෙමි. නමුත් අද අප මව්බිම මුහුණ පා ඇති වර්තමාන ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් මෙතෙක් අප කෘතහස්ත සිනමා කලාකරුවන්ගෙන් සිදු වී ඇති 'සේවය' කුමක්ද? යුද්ධය පිළිබඳ අත්දැකීම්, ඒ පිළිබඳ කම්පනය මෙතෙක් යම් යම් සිනමා අධ්‍යක්ෂවරුන් විසින් සිනමාකෘති ලෙසින් එළි දක්වා ඇත. නමුත් අවාසනාවන්ත මහා යුද්ධය පිළිබඳව මෙතෙක් නිපදවනු ලැබූ ඒ සියලුම සිනමා කෘතිවලින් කර ඇත්තේ සමස්තයක් වශයෙන් සෙබලාගේ/සෙබළ බිරියගේ ආත්මගෞරවයට පහරදීම, හමුදා සේවය නිර්දය ලෙස හෙළා දැකීම හෝ අවඥාවට ලක්කිරීම සහ සිංහල සංස්කෘතිය පාවාදීම බැව් පෙනී යයි. සුප්‍රකට චිත්‍රපට විචාරක තිස්ස ප්‍රේමසිරි මහතා ලියා ඇති පරිදි සිනමා කෘතියක් යනු ජීවිතයේ කාලකන්නිකම පමණක් ඉස්මතු කරන දැඩි උත්සාහයක් නොවිය යුතු අතර එය ජීවිතය අරභයා කලාකරුවා දකින වටිනාම දෙය වන 'මනුෂ්‍යත්වය' ඉස්මතු කරවන සෞන්දර්යාත්මක වෑයමක්ද සිදුවිය යුතුය. මා සිතන විදිහට ජාතික ප්‍රශ්නයක් වන යුද්ධය අරභයා සිනමාවක් නිපදවන අධ්‍යක්ෂවරයා එම වටිනා 'මනුෂ්‍යත්වය' තුළ මා පෙර සඳහන් කළ සෙබලා කෙරෙහි වූ ගෞරවයද අන්තර්ගත කිරීමේ සුන්දර වෑයමකද නිරතව සිටිය යුතුය. වර්තමාන ජාතික ප්‍රශ්නය තුළ සිනමාකරුවාගෙන් මව්බිමට සිදුවිය යුතු සේවය එය නොවේද?

නමුත් අද? අශෝක හඳගම මහතාගේ, යුද්ධය අරභයා ඔහු නිර්මාණය කළ 'මේ මගේ සඳයි' චිත්‍රපටය ඇරඹෙන්නේ අමන වෙස්ගත් අසංවර 'සිංහල' සොල්දාදුවකු දෙමළ යුවතියක බංකරයක් තුළ දූෂණය කිරීමේ දර්ශනයකිනි. ජනාධිපති සම්මානයෙන්ද පුද ලද එම චිත්‍රපටයෙහි බොහෝ අවස්ථාවල පෙන්වනුයේ ලක්පුර වැසියන් පදුරු අස්සේ සහ කැලෑ රොදවල තුළ බල්ලන් බළලුන් සේ සංසර්ගයේ යෙදෙන ආකාරයයි. මිය ගිය සෙබලා දවන සෑයේ ගිනිපෙල්ලෙන් තවෙකෙක් සිගරට්ටුවක් දල්වන අයුරුත් එම මියගිය සෙබලාගේ (දරුවෙකුද පිළිසිඳ ඇති) බිරිඳ තම සැමියාගේ චිතකයේ ගිනි නිවෙන්නත් පළමු කැලෑරොදකදී ප්‍රධාන නළුවාව පිස්සියක සේ සිපගන්නා අයුරුත් පෙන්වයි. යථාර්ථය එයද? පන්සලේ භික්ෂුවද සිවුර පදුරක් මත දමා පෙරකී දෙමළ යුවතිය හා රමණයෙහි යෙදෙන අයුරු නගවයි. යුද්ධයේ ප්‍රතිවිපාක පෙන්වීමට යැයි පවසමින් නිර්මාණය කරන ලද මෙම චිත්‍රපටයෙන් සිංහල සොල්දාදුවා, උතුම් සෙබළ බිරින්දෑත්, සිංහල සංස්කෘතිය සහ බෞද්ධ භික්ෂුව මොනතරම් නීච අයුරින් අවඥාවට හා සමච්චලයට භාජන කර ඇත්ද? මෙවන් චිත්‍රපට වලට ඉතා සූක්ෂම අයුරින් සංවිධානය වී අන්තර් ජාතික සම්මානයන් ලබාදී ලෝකයේ විවිධ රටවල ප්‍රදර්ශනය කරන විට අපේ මව්බිම සම්බන්ධව ලෝකයාගේ සිත්තුළ ඇතිවන ආකල්පය කෙබඳු විය හැකිද? ත්‍රස්තවාදීන් අවි දැරීම සාධාරණීය කිරීමට එයත් පිටිවහලක් නොවන්නේද?

මහදිවුල්වැව මහතාගේ සුදු කළු සහ අළු චිත්‍රපටයේද සෙබලාගේ බිරිඳ ඔහු නිවාඩු නොමැතිව නිවසට නොපැමිණෙන නිසා වෙනත් සල්ලාලයෙකු හා රති කෙලියේ යෙදෙනු පෙන්වයි. එහිද සමස්තයක් වශයෙන් ගත් කල සෙබලා සහ හමුදා සේවය [illegible] අන්දමින් සමච්චලයට ලක් [illegible] හා සිවුරක් පොරවා ගත් පමණින් භික්ෂුවක් වීමට පුළුවන් බවත්, ගම්වැසියන් යන එවැනි ඕනෑම ජඩයෙකු පන්සලක් අල්ලා ගත් පමණින් භික්ෂුවක් ලෙස පිළිගැනීමට සූදානමින් සිටින අමන මෝඩ රැළක් බවත් සාක්ෂාත් කිරීමට ඔහු වෑයම් දරයි. එය සත්‍යයක්ද? මෙවන් කලාකරුවනට යුද්ධය/සෙබලා කියූ පමණින් සෙබළ බිරිඳ පිළිබඳව සිහියට නැගෙනුයේ සැමියා සේවයට ගිය සැනින් අල්ලපු ගෙදර මිනිසා සමඟ සංසර්ගයේ යෙදීමට මානබලා සිටින, රති කෙලියම යුග ජීවිතය යැයි සිතන, සාමයෙන් මුසපත් වූ ගෑහැනියක් ලෙස පමණක් බව පෙනීම කෙතරම් සෝචනීයද? රටේ ස්වාධීපත්‍යය සඳහා කෙරෙන යුද්ධය, එය වෙනුවෙන් දිවිපුදන සෙබලා සහ ඔහු වෙනුවෙන් උදාර කැපකිරීමක් කරන උතුම් සෙබළ බිරිඳ පිළිබඳව මීට වඩා වෙනස්, ගුණාත්මක අයුරින් බැලීමට අපේ ප්‍රවීන කෘතහස්ත සිනමාකරුවන්ට හිත නොදීම කෙතරම් නම් අභාග්‍යයක්ද?

යුද්ධයේ කාලකන්නිකම පමණක් පෙන්වීමට සැදීපැහැදී සිටින මෙම චිත්‍රපට අධ්‍යක්ෂවරුන් බොහෝ විට තම මතයන් සනාථ කිරීමට යථාර්ථයෙන් බැහැරව කටයුතු කිරීමද පිළිකුල් කටයුතු දෙයක් බව කිව යුතුවේ. දැය වෙනුවෙන් දිවිපුද හමුදා උත්තමාචාරය සහිතව සිය සගයන් මැද අවසන් ගමන් යන රණවිරුවකුගේ දැවෙන චිතකයේ ගිනිපෙල්ලකින් හැකිනම් සුරුට්ටුවක් පත්තුකර ගන්නා මෙන් මා හඳගම මහතා හට අභියෝග කරමි. ඉන්දීය සිනමාවේ බිරිඳක් තම සෙබළ සැමියාගේ දැවෙන චිතකයට පැන දිවි නසා ගන්නා අයුරු පෙන්වයි නම් එහි යථාර්ථයක් තිබිය හැක. සති පුරාවට ඉන්දියාවේ තිබූ [illegible] තම සෙබළ සැමියාගේ චිතකයේ අළු [illegible] වෙනත් පුරුෂයෙකු [illegible] සිපගන්නා බිරින්දෑත් සිටින්නේ හඳගමගේ මනෝ ලෝකයේ පමණක් බව අප කවුරුත් දන්නා කරුණකි. නමුත් එතුළින් හඳගම සමස්ත සෙබළ බිරින්දෑන්ටම කර ඇති අපහාසය සම්බන්ධයෙන් නිසි කටයුතු කිරීම එම කාන්තාවන්ටම භාරදිය යුතුය.

එසේම සෙබළ සැමියා හට නිවාඩු නොමැතිකමින් නිවසට පැමිණීමට අපොහොසත්වීම හේතුවෙන් සල්ලාලයන් හා යහන්ගත වන බිරින්දෑත් නොව විවාහ වී කෙටි මධුසමයකින් පසු ප්‍රථම වරට උතුරට ගොස් රට වෙනුවෙන් දිවි පුද යළි කිසිදු දිනෙක තමා වෙත නොඑන සැමියා වෙනුවෙන් කැපවී, පතිවතාව රකිමින්, ඔහුට පින්පෙත් පමුණුවමින්, තමාගේත් මියගිය සැමියාගේත් ආත්ම ගෞරවය කෙළෙසා නොගෙන ජීවත්වන උතුම් කුල කාන්තාවන් රැසක් අප සමාජයේ සිටින බැව් දනී දැයි, මී හරක් බලන තුනක් කොල්ලන් වුවද හමුදාවට බැඳීමට සූදානම් යැයි වක්‍රාකාරව කියන සුදත් මහදිවුල්වැව මහතාගෙන් ප්‍රශ්න කිරීමට කැමැත්තෙමි. මව් බිම වෙනුවෙන් සටන් බිමට ගොස් අතපය පමණක් නොව දෑස් පවා අහිමි වූ ආබාධිත සෙබළුන් හා විවාහ වී තම සැමියාට කවා පොවා පණ මෙන් රැක ගනිමින් තම යෞවන සුන්දර දිවිය ඔහු වෙනුවෙන්ම කැප කරන දැහැනකාමී ශ්‍රේෂ්ඨ සිංහල තරුණියන්ද අප අතර සිටින බැව් විමුක්ති ජයසුන්දරයන් සමහරවිට විශ්වාස නොකරනු ඇත. සයුරේදී මරාගෙන මැරෙන ප්‍රහාරයකට ලක්ව නෞකාව පිපිරීම කුඩා කැබලිවලට කැඩී ගොස් මුහුදටම දිය වී 'අන්තර්ධානව' ගිය නැවියකුගේ මවට, පියාට, [illegible] ඔහු මියගිය පුවත සැලකිරීමට නිවසට යන හමුදා නිලධාරියාගේ මානසික තත්ත්වය කෙබඳුද යන්න ගැන කවර දිනක හෝ සිතා ඇත්දැයි ප්‍රසන්න විතානගේ මහතාගෙන් විමසීමට කැමැත්තෙමි.

අපේ අසල්වැසි ඉන්දියාවේ යුද්ධය සම්බන්ධව සෙබලාගේ චිත්ත ධෛර්යය වඩවන, ඔවුන්ගේ නිර්භීත බව හුවා දක්වන, ජාතිකාභිමානය නංවන චිත්‍රපට මිස ඉන්දීය සෙබලා කාශ්මීරයේ යුදවදින විට බොම්බායේ සිටින ඔහුගේ බිරිඳ අසල මුඩුක්කුවක වෙසෙන පරයකු හා සංවාසයේ යෙදෙන දර්ශන ඇතුළත් එකදු චිත්‍රපටයක් හෝ මෙතෙක් ඉන්දියාවේ බිහි වී නැත්තේ ඇයිදැයි පිළිතුරු දෙන මෙන් ඉහත සඳහන් අධ්‍යක්ෂවරුන් සිව්දෙනාගෙන්ම ඉල්ලා සිටීමටද කැමැත්තෙමි. ඊට හේතුව මිලියනයක් පමණ වූ සමස්ත ඉන්දීය හමුදා සෙබළුන්ගේ එකදු බිරියක්වත් අයාලේ නොයන නිසාද, නැතිනම් ඉන්දීය සිනමා අධ්‍යක්ෂවරුන් හට ඔවුනට මෙන් යුද්ධයේ ඇති අමිහිරි යථාර්ථය තත්වාකාරයෙන් එළි දැක්වීමට ඇති අදක්ෂතාවය නිසාද, නැත්නම් යුද්ධය නිසා අසහනයෙන් [illegible] පවත්නා දැඩි ලිංගික පරිපීඩනය අවබෝධ කර ගැනීමට තරම් තමන්ට මෙන් කලා විඥානයක් ඔවුන් සතු නොවීම නිසාද, එසේත් නැතහොත් තම දේශය, මව් බිම රැක ගැනීමට ස්වකීය දිවිය, නිදහස මෙන්ම පවුල් ජීවිතයද මුළුමනින්ම කැප කරන තම ආදරණීය සෙබළ සොයුරු විරුවනට තම හද තුළ පවතින දැඩි භක්තිය හා ගෞරවය නිසාද යන්න ගැනද විමසා බලන මෙන් ඔවුන් සැමගෙන් අවසාන වශයෙන් මා ඉල්ලා සිටිමි.

යුද්ධය අද ජාතික ප්‍රශ්නයක් වන බැවින් යුද්ධය අරභයා සිනමා කෘතියක් නිර්මාණය කිරීමේදී ඒ ගැන මීට මතුවට හෝ දැඩිසේ සැලකිලිමත් විය යුතු බව මගේ හැඟීමයි. යුද්ධයේ තිබෙන බිහිසුනු කම ඕනෑම මන්ද බුද්ධියෙකුට හෝ වැටහෙන දෙයකි. එයින් ඉන් සමාජයට, ජන ජීවිතයට වන හානි හුවා දැක්වීම සඳහා කොතෙකුත් සිනමාකෘති නිර්මාණය කළද ප්‍රශ්නයක් නැත. නමුත් රට දෙකඩ වීමේ තර්ජනයට මුහුණ පා ඇති මෙවන් තත්ත්වයක් මත එවන් නිර්මාණ තුළින් සෙබලාගේ, සෙබළ බිරියගේ ආත්ම ගෞරවයට හානි පමුණුවන්නම්, හමුදාව, හමුදා සේවය හෙළා දැක ඇත්නම්, එසේත් නැතහොත් අනාගතයේදී රට වෙනුවෙන් ඉදිරිපත් වීමට සිටින තරුණ තරුණියන්ගේ මනස ව්‍යාකූල කරමින් ඔවුන් ඒ සඳහා අධෛර්යවත් කරන්නම් ඊට විවෘතව විරුද්ධත්වය පෑමට දැන් කල් එළඹ ඇත.

කවුරුන් කෙසේ කීවත් යුද්ධයේ කුරිරු යථාර්ථය මානව සංහතියට බලපාන අයුරු, යුද්ධය නිසා සමාජය පීඩා විඳින අන්දම යනාදිය කලා මාධ්‍යයන් තුළින් එළි දැක්වීමේදී එයට කාටවත් 'තහංචි' දැමිය නොහැකි යැයි වහසි බස් දොඩන කලාකරුවන් මෙතෙක් යුද්ධය නිසා එල්. ටී. ටී. ඊ. මග හස්තයට හසු වී අනේකවිධ පීඩනයට ලක්වූ දෙමළ ජන සමාජය සම්බන්ධයෙන් කිසිම නිර්මාණයක් කර නොමැති වීම විශ්මයට කරුණක් නොවන්නේද?

තම දරුවන් බලෙන් පැහැරගෙන යෑම වැළැක්වීමට ඉදිරිපත් වන විට මිලේච්ඡ අයුරින් පහරදීමට ලක්වන දෙමළ පියවරුන් ගැන හෝ මුහමලෙයි මුර කපොල්ල අසලට වී පාසලින් උදුරාගත් තම දරුවන් ත්‍රස්තපාලන පෙදෙසට රැගෙන යාදැයි සෑම වාහනයකටම වැලපෙමින් එබී බලන අහිංසක දෙමළ මව්වරුන් පිළිබඳව හෝ ත්‍රස්තයනට කප්පම් දිය නොහැකිව පවුලට ඇතිවන තර්ජන හමුවේ දිවිනසා ගන්නා අහිංසක දෙමළ සුළු ව්‍යාපාරිකයන් පිළිබඳ හෝ ඒ හා සමාන අනේක විධ දුක්ඛිතයන් තුළින් අහිංසක දෙමළ ජන ජීවිතයක කඩා වැටීම පිළිබිඹු කරනු වස් සිනමා කෘතියක් එළි දැක්වීමට උක්ත කලාකරුවනට මෙතෙක් හිත නොදෙන්නේ මන්දැයි විමසනු වටී.

ජූලි කලබල සමයේ අහිංසක දෙමළ ජනතාවට සිදු වූ අසාධාරණකම් හෙළි කිරීමට සිනමා/ටෙලිවෘතාන්ත ගණනාවක්ම බිහි වී ඇතත් අරන්තලාව භික්ෂු ඝාතනය, දළදා හිමි ප්‍රහාරය, ශ්‍රී මහා බෝධි අභියස සිදු වූ සමූලඝාතනය, කිතුල් ඔය [illegible] කාත්තන්කුඩි හි අහිංසක ජනයා [illegible] කපාකොටා මරා දැමූ සිද්ධීන් තුළින් ඇතිවූ ජනජීවිත කම්පනය අල්ලා කිසිදු නිර්මාණයක් මෙතෙක් බිහි වී නොමැති බැව්ද අප දනිමු. යුද්ධය කියූ පමණින් රට වෙනුවෙන් දිවි පුදන සිංහල සෙබළුන්ගේ බිරින්දෑත් අයාලේ යෑම සහ එසී රණවිරුවන් අවමානයට ලක්කිරීම යනාදිය පමණක් පාදක කොටගෙන මෙම කලාකරුවන් නිර්මාණය කිරීමට පෙළඹීමේ හේතුත් සෙවීම දිවයිනේ මනෝ විද්‍යාඥයන්ට පැවරිය යුතු කාර්යයක් බවට අද පත්ව ඇත.

යම් අමන පිරිසක් අතින් විනාශ වූ යාපනය පුස්තකාලයට ආධාර පිණිස සිය 'යුධ' සිනමා ත්‍යාග මුදල් සියල්ලම පරිත්‍යාග කිරීමට නොපසුබට වන කලාකරුවා කුරිරු ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් විනාශ වූ ලොව බෞද්ධ මුදුන් මල්කඩ වන සිරි දළදා මැදුර පිළිසකර කිරීමට ශතයක් ප්‍රදානය කිරීමට ඉදිරිපත් නොවීම නිසා ඔහුගේ යාපන පුස්තකාල ආධාරය ත්‍රස්තවාදය නිසා ඇති වූ කුඩු අනුකම්පාව මුල්කර ගෙන සිදුවූවක්ද එසේත් නැතහොත් වෙනත් අදහසක් මුදුන්පත් කර ගැනීමට කරන ලද වෑයමක්ද යන්න ගැන සාධාරණ සැකයක් මතුව තිබේ.

අද ආරක්ෂක හමුදාවන්හි සෙබළා 'සාමය' වෙනුවෙන් අති විශාල කැපවීමක් කරමින් සිටී. සටන් විරාම කාලය තුළ ත්‍රස්තවාදීන් අසීමිත ලෙස ශක්තිමත් වූ අතර හමුදා පුද්ගලයන් සැහෙන ප්‍රමාණයක් ත්‍රස්තයන් අතින් අදටත් ඝාතනය වෙමින් පවතී. ත්‍රස්තයන්ගේ එවන් අතිශය කුරිරු ප්‍රකෝපකාරී ක්‍රියා හමුවේ යුද්ධයක් නැවත ඇතිවීම වළක්වාලනු වස් අසීමිත සංයමයෙන් සහ ඉවසීමෙන් කටයුතු කරන සෙබලා නැවතත් යුද්ධයක් ඇතිවුවහොත් ඊට සාර්ථකව මුහුණ දී රට බේරා ගැනීමට කෙතරම් පසුබෑමකට ලක්වුවද උසස් චිත්ත ධෛර්යයකින් සිටීමට සැමවිටම වෑයම් කරයි. [illegible] උපකරණ තිබුණද බොහෝ විට [illegible] උපකරණ මත නොව ඒවා හසුරුවන සෙබලාගේ චිත්ත ධෛර්යය මත බැව් අපි දනිමු. එබැවින් ත්‍රස්තයාද විවිධ උපක්‍රමයන් මගින් උත්සාහ කරනුයේ සෙබලාගේ චිත්ත ධෛර්යයට සැම විටම මරු පහරක් එල්ල කිරීමටයි.

එසේ නම් යුද්ධය අල්ලා මේ රටේ නිර්මාණය කෙරෙනු ලබන ඕනෑම චිත්‍රපටයක් තුළින් රටේ නීත්‍යානුකූල හමුදාව සහ සෙබලා ගැරහීමකට ලක්කෙරේ නම්, ඒ තුළින් සෙබලාගේ චිත්ත ධෛර්යයට අහිතකර බලපෑමක් ඇති කරයි නම් එය ත්‍රස්ත අරමුණු සාක්ෂාත් කරදීමට වනුව අනුබලදීමක් ලෙස අප දකිමු. යමෙක් එය දැනුවත්ව කරයි නම් එය දේශද්‍රෝහී ක්‍රියාවක් වන අතර උන්ට නිසි දඬුවම් පැනවිය යුතුය. නොදැනුවත්කම නිසා කර ඇත්නම් ඒ වරද ඉදිරියේදී නිවැරදි කරගන්නා ලෙසද, මතු යුධ නිර්මාණයන්හිදීවත් හමුදාවේ, සෙබලාගේ සෙබළ බිරියගේ ආත්ම ගෞරවයට හානි නොවන අයුරින් කටයුතු කර ජීවිතයේ කාලකන්නි පැත්ත පමණක් නොපෙන්වා එය තුළින් මවුබිම වෙනුවෙන් දිවිහිමියෙන් කැපවන සෙබලා පිළිබඳව ගෞරවනීය හැඟීමක් මතු කරවන ආකාරයේ සෞන්දර්යාත්මක වෑයමකද නිරතවන මෙන්ද හඳගම, මහදිවුල්වැව වැනි කෘතහස්ත, ප්‍රතිභාපූර්ණ, දක්ෂ, ප්‍රවීණ කලාකරුවන්ගෙන් මහත්වූ භක්තියකින් යුතුව ඉල්ලා සිටිමි.